# ප්‍රාථමික අවධියේ සිසුන්ගේ අධ්‍යාපන සාධනය කෙරෙහි පවුල් පරිසරයේ බලපෑම පිළිබඳව කෙරෙන අධ්‍යයනය

ජී.ඒ.එම්.ටී.පී. ගුණරත්න
විද්‍යාවේදී (පේරාදෙණිය වි.වි)
අධ්‍යාපන ඩිප්ලෝමා (කොළඹ වි.වි)
අධ්‍යාපනපති (කොළඹ වි.වි)

UCLIB
539980

කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධය

ලියාපදිංචි අංකය 2003/M.Phil/(T)/07

## සංක්ෂිප්තය


අධ්‍යාපනය ලැබීම මානව අයිතියක් ලෙස පිළිගෙන සැමටම අධ්‍යාපනය ලබාදීමේ අරමුණින් සම අධ්‍යාපන අවස්ථා සැලසීම කෙරෙහි ශ්‍රී ලංකාව ඉමහත් උනන්දුවක් දක්වයි. අධ්‍යාපන ප්‍රවේශයට මෙන්ම අධ්‍යාපනයේ රැඳී සිටීමට ද අධ්‍යාපන ඵල ලබා ගැනීමට ද සමාන අවස්ථා උදා කිරීමේ අයිතිය සම අධ්‍යාපන අවස්ථා සංකල්පය යටතේ අපේක්ෂා කෙරෙයි. එහෙත් විවිධ සමාජ පරිසර විෂමතාවල බලපෑම නිසා මේ සම්බන්ධයෙන් ගැටලු මතුවන බව පෙනේ. විවිධ සාමාජීය පරිසර අතරින් පවුල් පරිසරය අධ්‍යාපන අවස්ථා කෙරෙහි බලපාන වැදගත් සාධකයක් වේ. වර්තමානයේ අධ්‍යාපනය ආයෝජනයක් ලෙස සැලකෙන හෙයින් ද, සම අධ්‍යාපන අවස්ථා සැලසීම අපේක්ෂා කරන හෙයින් ද, සම්පත් නාස්තිය අවම කර අධ්‍යාපනයේ උපරිම ප්‍රතිලාභ සිසුන්ට අත්පත් කරදීමට පියවර ගැනීම සඳහා ප්‍රාථමික අධ්‍යාපන අවධියේ සිසුන්ගේ අධ්‍යාපන සාධනය කෙරෙහි පවුල් පරිසරයේ බලපෑම විමසීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ විය.

පවුල් පරිසරය ආශ්‍රිත විචල්‍ය හා අධ්‍යාපනය අතර ඇති සම්බන්ධය අනාවරණය කෙරෙන දේශීය හා විදේශීය අධ්‍යයන මෙම පර්යේෂණය සඳහා ආධාර කර ගන්නා ලද අතර ප්‍රධාන අරමුණු හතරක් ඔස්සේ අධ්‍යයනය සැලසුම් කරන ලදී. ශිෂ්‍ය සාධනය හා දෙමාපියන්ගේ අධ්‍යාපනික, සමාජ ආර්ථික තත්ත්වය අතර සම්බන්ධතාවයේ බලපෑම, ශිෂ්‍ය සාධනය හා නිවසේ ඉගෙනුම් පරිසරය අතර සම්බන්ධතාවේ බලපෑම, ශිෂ්‍ය සාධනය කෙරෙහි දෙමාපිය ආකල්ප හා අපේක්ෂණ අතර සම්බන්ධතාවේ බලපෑම, ශිෂ්‍ය සාධනය කෙරෙහි දෙමාපියන් පාසල හා ප්‍රජාව සමඟ දක්වන සම්බන්ධතාවේ බලපෑම විමසීම එම අරමුණුවලට අයත් විය.

අධ්‍යයනය සඳහා අවශ්‍ය දත්ත රැස්කිරීමට නියැදි කිහිපයක් තෝරා ගන්නා ලදී. කොළඹ හා පුත්තලම දිස්ත්‍රික්කවල විවිධ වර්ගයට අයත් රජයේ පාසල් 20 ක පස්වන ශ්‍රේණියේ සිසුන් 400 ක් හා ඔවුන්ගේ දෙමාපියන් 400ක් ද, තෝරාගත් පාසල්වල පන්තිභාර ගුරුවරුන් 20ක් ද, අංශභාර ප්‍රධානීන් හෝ විදුහල්පතිවරුන් 20ක් ද, එම නියැදිවලට අයත් වූ අතර විස්තරාත්මක පර්යේෂණ ප්‍රවේශය යටතේ ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා මඟින් දත්ත රැස් කෙරිණි. ප්‍රතිශත හා සංඛ්‍යාන විද්‍යාත්මක ක්‍රම මඟින් දත්ත විශ්ලේෂණය සිදු කෙරිණි. අවශ්‍ය අවස්ථාවල ප්‍රස්තාර හා රූප සටහන් ද යොදා ගැනිණි.

දත්ත විශ්ලේෂණයේ දී අනාවරණය වූ කරුණු අනුව පාසල් පරිසරය ආශ්‍රිත විචල්‍ය සමඟ සිසුන්ගේ අධ්‍යාපනික සාධනය සම්බන්ධතා දක්වන බව නිගමනය විය.

අධ්‍යාපනික සාධනය කෙරෙහි එක් එක් විචල්‍යයේ බලපෑම ප්‍රමාණාත්මකව වෙනස් විය. මවගේ හා පියාගේ අධ්‍යාපන මට්ටම, පියාගේ රැකියා තත්ත්වය, පවුලේ සමාජ ආර්ථික තත්ත්වය, නිවසේ ඇති අධ්‍යාපනික සම්පත් හා දෙමාපිය සුපරීක්ෂණය සිසු සාධනය කෙරෙහි ප්‍රබල බලපෑම් කළ විචල්‍ය වූ අතර, දෙමාපිය ආකල්ප හා අපේක්ෂා, දෙමාපියන් පාසල හා ප්‍රජාව සමඟ දක්වන සම්බන්ධතා සිසු සාධනය කෙරෙහි දුබල බලපෑම් ඇති කළ විචල්‍ය විය. පාසල්වල සාධන මට්ටම් වෙනස් වූ අතර එම පාසල්වල සාධනය තීරණය වීම කෙරෙහි පාසල් නියෝජනය කරන දෙමාපියන්ගේ අධ්‍යාපනය, සමාජ ආර්ථක තත්ත්වය හා නිවසේ ඉගෙනුම් පරිසරය හේතු විය. ඒ අනුව පවුලේ අධ්‍යාපනික, මූල්‍ය, සංස්කෘතික හා සමාජ ප්‍රාග්ධනය විවිධ ප්‍රමාණයෙන් සිසු සාධනය කෙරෙහි බලපාන බව මෙම අධ්‍යයනයෙන් අනාවරණය විය. එබැවින් අවසානයේ දී පවුල් පරිසරයේ බහුවිධ බලපෑම් සංකල්පය (Multidimensional Influences Concept of Family Enviornment) සිසුන්ගේ අධ්‍යාපන සාධනය සම්බන්ධයෙන් බොහෝදුරට ක්‍රියාත්මක වන බව නිගමනය කළ හැකි විය.

පවුල් පරිසරයෙන් ඇතිවන අහිතකර බලපෑම් අවමකර සිසු සාධනය නැංවීම සඳහා, දිළිඳු දෙමාපියන්ගේ ආර්ථිකය නඟා සිටුවීමට අවශ්‍ය පියවර ගැනීම සිසුන්ගේ සාධන මට්ටම් නැංවීමට අවශ්‍ය උදව් ලබාදිය යුතු ආකාරය පිළිබඳ දෙමාපියන් දැනුවත් කිරීම හා වැඩි සාඵල්‍යතාවක් ලබා ගත හැකි ලෙස පාසල් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය දැනට වඩා ක්‍රමවත් කිරීම පිළිබඳ රාජ්‍ය මට්ටමින් හා පාසල් මට්ටමින් ගත හැකි පියවර කිහිපයක් යෝජනා කිරීමටද, අනාගතයේ දී පර්යේෂණයට භාජනය විය යුතු ක්ෂේත්‍ර කිහිපයක් පෙන්වා දීමට ද අවසානයේ හැකි විය.

අධ්‍යාපනයේ උපරිම ඵල නෙළාගෙන අනාගත ලෝකයට සාර්ථක ලෙස මුහුණදීමේ හැකියාව සමස්ත පරපුරටම උදා කරලීමට මෙම පර්යේෂණය තුළින් හෙළිකර ගන්නා තොරතුරු සුළු වශයෙන් හෝ දායක වේ යැයි පර්යේෂිකාව අපේක්ෂා කරයි.

## Abstract

Sri Lanka accepts education as a human right and gives a prominence to provide equal opportunities with the objective of providing education for all. Under equal opportunities concept it is expected to admit to education and remain in the process of education and to gain maximum outcomes and benefits by each and every one.

Due to various socio - environmental differences it is evident that various problems have arisen in relation to provision of education. Out of which the home environment has become a major problem affecting the provision of educational opportunities.

As education is treated as an investment at present and also as a special emphasis is given to promote equal educational opportunities, this study mainly examines how the home environment does influence the primary education of the children in order to minimize the wastage of resources and let the children to reap the maximum benefits of education.

Local and foreign studies that reveal the variables related to the home environment and its influence on school education is discussed in this study and four objectives have been used for the present study. The objectives include the following

- (i) Examining the correlation between the parents educational and socio - economic level and children's academic achievements
- (ii) Studying the influence of environment on learning and its influence on children's learning achievements
- (iii) studying the beliefs and attitudes of parents and their influence on children's learning
- (iv) studying the influence of the relationships that parents maintain with the school on the children's learning achievements.

Some random samples were used in the present study. 20 Government schools (of various categories) were selected from Colombo and Puttlam Districts. 400 students of

Year V, their parents amounting to 400, 20 Class Teachers, Sectional Heads and 20 Principals of the said respective schools were selected for the study. Data were collected by using questionnaires and interviews as main instruments. Diagrams and illustrations were used when necessary. In the interpretation of Data analysis has revealed that there is a correlation between the children's educational achievement and the variables related to the home environment.

The educational level of the father and that of the mother, the father's occupation, socio - economic situation of the family, supervision of the parents were important variables influencing the children's academic achievements.

It was revealed through analysis that there are differences in levels of achievement by schools. Also the educational levels and socio - economic levels of respective parents and the available learning environment of homes had an influence in determining the level of achievement of individual schools. Accordingly it was revealed in the study that the educational level of the family, fiscal, cultural and social capital of the family have influenced the students achievement level in different degrees. Eventually the findings of the study have been able to prove the multidimensional influences concept of the family environment on children's educational achievement.

Also the study was able to highlight the negative influence of family background and environment on children's educational achievement. Also the study was able to emphasize on measures that should be taken to upgrade the efficiency of children's education and improve the learning teaching process of the school and measures that should be adopted to enhance the awareness of parents about how children should be assisted in their studies.